## භූගෝල විද්‍යාව - ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය - 4 පාඩම - 10 ශ්‍රේණිය.

## ක්‍රියාකාරකම් පත්‍රිකාව - පිළිතුරු පත්‍රය.

1. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය තුළ වී වගාව වඩාත් වැදගත් වීමට හේතු 4 ක් දක්වන්න.

    ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රධාන ආහාරය වීම

    දේශීය වෙළඳ භෝගයක් වීම.

    කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සැපයීම.

    සහල් ආශ්‍රිත අතුරු නිෂ්පාදන බිහිවීම.

    ජෛන්ද්‍රිය පොහොර නිෂ්පාදනය.

    විවිධ රැකියා බිහිවීම.

2. වී වගාව සිදු කෙරෙන ප්‍රධාන කලාප 4 සහ ඊට අයත් තොරතුරු ඇසුරින් මෙම වගුව සම්පූර්ණ කර දක්වන්න.

| කලාපය | ප්‍රදේශ | වගාවේ ස්වභාවය | ලක්ෂණ |
|---|---|---|---|
| 1.වියළි කලාපය | අනුරාධපුර,මඩකලපුව, පොළොන්නරුව, වව්නියාව,අම්පාර, යාපනය ,හම්බන්තොට | යල සහ මහ ලෙස කන්න 2 ක් ඇත. ඇතැම් ප්‍රදේශවල අතරමැද කන්නයක්ද වගා කරයි. | වැසි ජලය මගින් ප්‍රධානව වගා කරයි.ගොඩ වී වගාව වාරි ජලය මගින් සිදු කරයි.යන්ත්‍ර සූත්‍ර බහුලව යොදා ගනී.බිම් ඒකකයකින් ලබන අස්වනු ප්‍රමාණය ඉහල ය. |
| 2.අතරමැදි කලාපය | කුරුණෑගල ,බදුල්ල, මොණරාගල,මාතර | වැඩිම බිම් ප්‍රමාණයක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇත.වැසි ජලයෙන් හා ජල සම්පාදනයෙන් සිදු කරයි. | බිම් ඒකකයකින් ලබන අස්වනු ප්‍රමාණය ඉහළය. යන්ත්‍ර සූත්‍ර බහුලව යොදා ගනී. |

| | | | |
|---|---|---|---|
| 3.තෙත් කලාපය | ගාල්ල,කළුතර,රත්නපුර, කොළඹ ,ගම්පහ,කෑගල්ල | ගංගා මිටියාවත් සහ පහත් ප්‍රදේශවල වගා කරයි. | ලබාගන්නා අස්වනු ප්‍රමාණය අඩුවේ. කුඩා බිම්වල වගා කරයි. ජල ගැලීම් බහුලය. |
| 4.කඳුකර බිම් | මහනුවර, මාතලේ, නුවර එළිය. | හෙල්මළු ක්‍රමයට වගා කරයි. | බිම් ඒකකයකින් ලබන අස්වනු ප්‍රමාණය අඩුය. |

3. වී වගාවට අවශ්‍ය භෞතික සාධක දක්වන්න.

    1900mm වැඩි වර්ෂාපතනය , 21c -35c අතර උෂ්ණත්වය,දියළු පස, අස්වනු නෙළන කාලයේ වියළි කාලගුණය

4. පිහිටීම සහ වගා කරන ප්‍රදේශ අනුව තේ වගා බිම් වර්ග කර දක්වන්න.

    උඩරට තේ - නුවරඑළිය

    මැදරට තේ - මහනුවර, මාතලේ ,දඹුල්ල

    පහත රට තේ - කළුතර, මාතර, ගාල්ල, හම්බන්තොට,කෑගල්ල, රත්නපුර

5. තේ වගාවට අවශ්‍ය සාධක දක්වන්න.

    1900 mm -5400 mm ක වර්ෂාපතනය ,15c -27 c උෂ්ණත්වය,ලෝම ලැටරයිට් පස,බෑවුම් ප්‍රදේශ, පුහුණු ශ්‍රමය , ප්‍රවාහනය ,වෙළඳපල

6. ශ්‍රී ලංකාවෙ පොල් ත්‍රිකෝණය සහ සුළු පොල් ත්‍රිකෝණය පිහිටි ප්‍රදේශ දක්වන්න.

    පොල් ත්‍රිකෝණය - කොළඹ, කුරුණෑගල , හලාවත

    සුළු පොල් ත්‍රිකෝණය - රත්න ,මිද්දෙණිය,ගාල්ල

7. පොල් වගාවට අවශ්‍ය සාධක දක්වන්න.

    2000mm -2500 mm ක වර්ෂාපතනය , 20c -27 c උෂ්ණත්වය , ලවණ මිශ්‍ර වැලි පස සහ රළි බිම් , ශ්‍රමය,වෙළඳපල

8. සුළු අපනයන භෝග යනු මොනවාද?

අපනයනය සඳහා කුඩා පරිමාණයෙන් සිදු කරන භෝග වගාවකි.

9. ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග වැදගත් වීමට හේතු දක්වන්න.

සම්ප්‍රදායික අපනයනවල මිළ උච්චාවචනය වීම , ප්‍රධාන භෝග කෙරෙහි පමණක් බලාපොරොත්තු තැබිය නොහැකි වීම , සුළු අපනයන භෝගවල ඉල්ලුම වැඩිවීම , දේශීය ජනතාවගේ ආදායම වැඩිකර ගත හැකි වීම, ප්‍රධාන භෝග වගා කළ නොහැකි බිම්වල වගා කළ හැකිවීම.

10. කඳුරට කලාපයේ වගා කරන එළවළු සහ පලතුරු භෝග දක්වන්න. ලීක්ස්, ගෝවා, කැරට්, බෝංචි, අර්තාපල්, පෙයාර්ස්, ස්ට්‍රෝබෙරි

11. ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සත්ත්ව පාලනය වැදගත්වීමට හේතු දක්වන්න.

පෝෂණ මට්ටම ඉහළ දැමීමට , ග්‍රාමීය ප්‍රදේශවල ජනයාට රැකියා අවස්ථා ලබාදීම , අතිරේක ආදායම් මාර්ගයක් ලෙස , වගා කටයුතු සඳහා යොදාගත නොහැකි බිම් වලින් ප් රයෝජනයක් ගැනීම , පොහොර ලබා ගැනීමට, විදේශ විනිමය ලබා ගැනීමට

12. ධීවර කර්මාන්තය කෙරෙහි බලපාන හිතකර සාධක දක්වන්න.

දූපතක් වීම , දිගු වෙරළ තීරයක්හිමිවීම(1760k.m.) , මහාද්වීපික තටකයක් පිහිටීම, බොකු, කලපු හා වරායන් පිහිටීම, ගංගා, ඇළදොළ, වැව්, ජලාශ පිහිටීම, මෝසම් කාලවලදී දියවැල් ක්‍රියාකාරිත්වය

13. කිවුල්දිය ධීවර කර්මාන්තය කෙරෙන ප්‍රදේශ දක්වන්න.

යාපනය, පුත්තලම, හලාවත, මීගමුව, මඩකලපුව, ආරුගම්බොක්ක

14. ශ්‍රී ලංකා ආර්ථිකයට කෘෂිකර්මයේ ඇති වැදගත්කම පිළිබඳ කරුණු දක්වන්න.

දළ දේශීය නිෂ්පාදිතයට 11.1%ක දායකත්වයක් ලබා දෙයි.

අපනයන ආදායමෙන් 24% ක් කෘෂි අංශයේ නියැලීම.

ශ්‍රම බලකායෙන් 31% ක් කෘෂි අංශයේ නියැලීම.

වැඩි බිම් ප්‍රමාණයක් යෙදවීම.

ආහාර නිෂ්පාදනයට හා කර්මාන්තවලට අමුද්‍රව්‍ය සැපයීම.